සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**

**Buddhist Civilization - I**

45 S I

පැය 02 යි

**Time: 02 hours**

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1)(2)(3)(4)(5) යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න

1) වෛදික සාහිත්‍යයට අනුව මහා බ්‍රහ්මයා විසින් මිනිස් වර්ගයා මවා ඇත. එසේ චතුර් වර්ණය නිර්මාණය කිරීමේ පදනම ලෙස භගවත් ගීතාවේ සඳහන් කරන්නේ,

1.නියති වාදයයි 2.නිර්මාණ වාදයයි 3.උච්ඡේද වාදයයි
4.ශාස්වත වාදයයි 5.ගුණ කර්ම විභාගයයි

2) භාරතීය සමාජයෙහි තම බලය රැක ගනිමින් ආධිපත්‍ය ගොඩනැගීම සඳහා විවිධ උපක්‍රම යෙදූ බමුණන් ඒ සඳහා යොදා ගත් ප්‍රධාන ඉගැන්වීමක් වූයේ,

1.ක්ෂත්‍රියයන් විසින් රාජ්‍ය පාලනය කළ යුතු බවයි
2.යාගය උසස් ආගමික කටයුත්තක් ලෙස අගය කිරීමයි
3.වර්ණ ධර්ම සංකල්පය හඳුන්වා දීමයි
4.අනාර්යන්ගේ අයිතීන් අහිමි කිරීමයි
5.බ්‍රහ්ම සහව්‍යතාවය ඉතා උසස් ලෙසින් අගය කිරීමයි

3) බමුණු පූජකවරු විසින් ස්ව ධර්ම සංකල්පය සමාජ ගත කළේ පාරම්පරික රැකී රක්ෂා ක්‍රමය අඛණ්ඩව පවත්වා ගැනිම සඳහාය. ඒ අනුව ප්‍රජා පාලනය හා කෘෂිකර්මාන්තය පැවරී තිබුණේ

1.බමුණන්ට හා ක්ෂත්‍රියන්ටය.
2.වෛශ්‍යයන්ට හා බමුණන්ටය
3.ශුද්‍රයන් හා ක්ෂත්‍රියන්ටය
4.ක්ෂත්‍රියන් හා වෛශ්‍යයන්ටය
5.වෛශ්‍යයන් හා ශුද්‍රයන්ටය

4) සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය ස්වාභාව නියතියකට අනුව සිදුවන බව ප්‍රකාශ කළ ශාස්තෘවරයා වූයේ,

1.බුදුරජාණන් වහන්සේය
2.මක්ඛලී ගෝසාල තුමාය
3.පූර්ණ කස්සප තුමාය
4.අජිත කේස කම්බලී තුමාය
5.නිගණ්ඨනාථ පුත්ත තුමාය

5) ජීවිතයේ විවිධ අවස්ථාවලදී අනුගමනය කළ යුතු කාර්යයන් ද බමුණන් විසින් භාරතීය ජනතාවට හඳුන්වා දෙන ලදී. ඒ අනුව වාන ප්‍රස්ථ ආශ්‍රමයේදී අනුගමනය කළ යුතු ප්‍රධාන කාර්යය වූයේ,

1.තවුස්දම් රැකීම සඳහා වන ගත වීමයි
2.බිරිඳ සමග චාරිකාවේ නිරත වීමයි
3.ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමයි
4.පස්කම් සුව විඳිමින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමයි
5.බ්‍රහ්ම සහව්‍යතාවය පතා යෝගී භාවනාවල නිරත වීමයි.

6) රාජාණ්ඩු පාලනයක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

1.ව්‍යවස්ථාදායක විධායක අධිකරණ හා ත්‍රිවිධ බලතල එක් පුද්ග ලයකු සතුවීම.
2.ව්‍යවස්ථාදායක විධායක අධිකරණ හා ත්‍රිවිධ බලතල කණ්ඩායමක් මඟින් ක්‍රියාත්මක කිරීම.
3.බලය ව්‍යාප්ත කිරීම සඳහා මත්ස්‍ය න්‍යාය භාවිතා කිරීම.
4.පියාගෙ න් පසු පුතාට රජකම උරුමවීම
5.යුවරජු පුරෝහිත අධිකරණ නායක සේනාධිපති මඟින් බලය ක්‍රියාත්මක කිරීම.

7) බුදුරජාණන් වහන්සේ ලොව පහල වන විට භාරතීය සමාජයේ බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව බොහෝ දෙනා මානසික පීඩනයට ලක්ව සිටි බව විවිධ තොරතුරු අනුව පැහැදිලි වේ. වර්ණ ධර්ම සංකල්පය ඒ සඳහා බලපාන ලද එක් කරුණක් පමනි.එම වර්ණ ධර්ම සංකල්ප සහේතුකව ප්‍රතික්ෂේප කළ බුදු රදුන් ඒ සඳහා ජීව විද්‍යාත්මක කරණු ඉදිරිපත් කරනු ලැබූ සූත්‍ර දේශනාවක් වනුයේ,

1.අස්සලායන සූත්‍රයයි. 2.අම්බට්ඨ සූත්‍රයයි. 3.අග්ගඤ්ඤසූත්‍රයයි.
4.වාසෙට්ඨ සූත්‍රයයි. 5.මධුර සූත්‍රයයි.

8)කර්මය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමෙන් මෝක්ෂය ලැබිය හැකි බව ප්‍රකාශ කරමින් කර්මය ගෙවා අවසන් කිරීම සඳහා අත්තකිලමථානු යෝගය අනුගමනය කළේ,

1.ජටිලයන්ය. 2.ආජිවකයන්ය. 3.ජෛනයන්ය.
4.පරිබ්‍රාජකයන්ය. 5.තාපසවරුන්ය.

9) ත්‍රිපිටක සාහිත්‍ය ගත තොරතුරු හා ඉන්දීය ඉතිහාසය තොරතුරු අනුව පැහැදිලි වන්නේ බුද්ධ කාලීන භාරතයේ ඉතා දියුණු වෙළඳ ආර්ථිකයක් පැවති බවයි. එම කරුණු වඩාත් පැහැදිලි කළ හැකි හොඳම සාධකයක් වන්නේ,

1.ගැල් වෙළඳාම පැවතීමයි.
2.භාණ්ඩ හුවමාරුව වෙනුවට කාසි භාවිතය.
3.වාණිජ වෘත්තීය සමිති බිහි වීමයි.
4.වෙළඳාම තුළින් සිටුවර පන්තියක් බිහිවීමයි.
5.ජනප්‍රිය වූ වෙළඳ වරායවල් මාර්ග හා නගර බිහි වීමයි.

10) මිනිස් වර්ගයාගෙන් වැඩිම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන්ම වෙන් කොට දැක්විය හැක්කේ බුදුරජාණන් වහන්සේය. යනුවෙන් බුදුරජාණන් වහන්සේ පිළිබඳව ඇගයීමක් කළ නූතන චින්තකයා වූයේ,

1.මහාචාර්ය සෝණ්ඩර්ස්ය.
2.මහාචාර්ය ලක්ෂ්මි නරසුය.
3.මහාචාර්ය මැක්ස් මුලර්ය.
4.ඇල්බට් අයින්ස්ටයින්ය.
5.එඩ්වින් අර්නෝල්ඩ්ය.

11) ආපද් ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ විග්‍රහය විමර්ශනය කිරීමේදී පැහැදිලි වන නිවැරදි ප්‍රකාශය වන්නේ,

1.බ්‍රාහ්මණයාට අයත්වූ කාර්යයන් වෛශ්‍යයාට කළ හැකිය.
2.වෛශ්‍යයාට ක්ෂත්‍රියයාට අයත් කාර්යයන් කළ හැකි වීම.
3.වෛශ්‍යයාට අයත් කාර්යයන් ශුද්‍රයාට කළ හැකි වීම.
4.ක්ෂත්‍රියයාට අයත් කාර්යයන් බමුණාට කළ හැකිය.
5.ක්ෂත්‍රියයාට දන් පිළිගැනීම කළ හැකිය.

12) බුද්ධ කාලීන භාරතයේ විවිධ ආගම් පැවති අතර ඒවා බ්‍රාහ්මණ හා ශ්‍රමණ සම්ප්‍රදාය ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය. එම ශ්‍රමණ කණ්ඩායම් අතරින් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය තුළ දැකිය නොහැකි වූ ලක්ෂණයක් වන්නේ,

1.පුද්ගල ස්වාධීනත්වය අගය කිරීම.
2.කාමසුඛල්ලිකානු යෝගයෙන් යුතු පිළිවෙත් පිරීම.
3.පවිත්‍ර වූ කායික වාචසික හා මානසික ක්‍රියා ඇති බව.
4.මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම.
5.උපාදානයෙන් තොරව නිදහස් චින්තනය අගය කිරීම.

13) විවිධ අයුරින් පීඩාවට පත්ව සිටි කාන්තා සමාජයට වරප්‍රසාද හිමි කර දීමට ක්‍රියා කළේ බුදු දහමයි.ඒ අනුව කාන්තාවන්ට ලබාදුන් උසස්ම ආගමික ගෞරවයට සාධකයන් වන්නේ,

1.භික්ෂුණි ශාසනය ආරම්භ කිරීමයි.
2.උපාසිකාවන්ට තනතුරු පිරිනැමීමයි.
3.මාතෘත්වය අගය කිරීමයි.
4.අෂ්ටගරු ධර්ම හඳුන්වා දීමයි.
5.විශාඛාවගේ පූර්වාරාමය පිළිගැනීමයි.

14) බුදුරජාණන් වහන්සේගේ ශරීරය කොතරම් දුර්වල වුවද උන්වහන්සේගේ ප්‍රඥා ශක්තියේ කිසිඳු වෙනසක් නොවූ බව සඳහන් කරන්නේ,

1.දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේය.
2.අංගුත්තර නිකායේ අණන සූත්‍රයේය.
3.මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයේය.
4.මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයේය.
5.මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රයේය.

15) බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න විසඳූ ආකාර කිහිපයක් පිළිබඳව පෙළ දහමේ දැක්වේ. ඒ අතර විභජ්ජව්‍යාකරණීය යනුවෙන් අදහස් කළේ,

1.ඍජුව පිළිතුරු සැපයීමයි.
2.ප්‍රති ප්‍රශ්න විමසා පිළිතුරු ලබාදීමයි.
3.ප්‍රශ්න පසෙකින් තැබීමයි.
4.විශ්ලේෂණාත්මක පිළිතුරු ලබාදිමයි.
5.ශ්‍රාවකයාගේ අපේක්ෂාව අනුව කටයුතු කිරීමයි.

16) බෞද්ධ පාලකයා ලෝක පාලන ධර්මයන්ට අනුගතව ක්‍රියා කිරීම සමස්ත සමාජයේම යහපත පිණිස හේතු වෙයි. එම ධර්මය නම්,

1.පංචසීල ප්‍රතිපත්තියයි.
2.දසරාජ ධර්මයයි.
3.සතර සංග්‍රහ වස්තුයි.
4.සතර අගතියෙන් වෙන් වීමයි.
5.හිරි ඔත්තප්ප දෙකයි.

17) '' ඒකාන්තයෙන්ම මම තරණය කළෙමි, තරණය කරවන්නට මිදුනෙමි, මුදවන්නට දැමුනෙමි, දමනය කරවන්නට ශාන්ත වූයෙමි, ශාන්ත කරවන්නට අස්වැසුනෙමි, අස්වස්නට පිරිනිවියෙමි, පිරිනිවාලන්නට සමත් වෙමි'' යන ආකල්පය බුදුරජාණන් වහන්සේ තුල පැවතියේය. එම ආකල්පයෙන් අදහස් වන්නේ,

1.බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා ප්‍රඥා ගුණයය
2.බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහා කරුණා ගුණයයි
3.බුදුරජාණන් වහන්සේ තුළ පැවති පද්මාකාර ජීවිතයයි
4.බුදුරජාණන් වහන්සේ තුළ පැවති මාර්ගෝපදේශකත්වයයි
5.බුදුරජාණන් වහන්සේ තුළ පැවති තාදී ගුණයයි

18) සම්බුදු සසුන බැබලවීමට තනතුරු පහක් ලබමින් ගෞරවයට පත් වූයේ,

1.මහා කාශ්‍යප තෙරුන් වහන්සේය
2.නන්ද තෙරුන් වහන්සේය
3.රාහුල තෙරුන් වහන්සේය
4.ආනන්ද තෙරුන් වහන්සේය
5.ගවම්පති තෙරුන් වහන්සේය

19) බෞද්ධ ප්‍රතිපදාව අනුගමනය කිරීමටත්, ඥාන ප්‍රතිලාභය පිණිසත් පුද්ගලයා පොළඹ වන මනෝභාවය හැඳින්වීම සඳහා සුදුසුම වචනය වන්නේ,

1.කරුණාව යන්නයි 2.ප්‍රඥාව යන්නයි 3.ශ්‍රද්ධාව යන්නයි
4.සීලය යන්නයි 5.චාග යන්නය

20) සම්පත් පරිභෝජනයේදී කෙසේ එය සිදුවිය යුතුද යන්න කරුණු දක්වන බුදු සමය පරිභෝජන දර්ශනයක් ඉදිරිපත් කරයි. එහි සඳහන් '' අනජ්ඣාපන්න'' යන්නෙන් අදහස් කරන්නේ,

1.අවශ්‍යතා දැන පරිභෝජනයේ යෙදිය යුතු බවයි
2.අසීමිත ආශාවන්ගෙන් මුලා නොවිය යුතු බවයි
3.අන්ධයකු මෙන් ආශාවන් පසුපස නොයා යුතු බවයි
4.සම්පත් භාවිතයෙන් වැරදි දේට නොයා යුතු බවයි
5.අත්හැර යාමේ නුවණින් යුක්ත විය යුතු බවයි

21) භෞතික සම්පත් කළමණාකරනය ආයතනයක මනා පැවැත්ම සඳහා හේතු වෙයි. ඒ අනුව සම්පත් කළමණාකරනයෙහි යෙදෙන බුදුරජාණන් වහන්සේ විවිධ තනතුරු ප්‍රදානය කර ඇත. ඒ අතර භත්තුද්දේසකගේ වගකීම වී ඇත්තේ,

1.ආහාර බෙදා දීමයි 2.කැඳ බෙදා දීමයි 3.ධාන්‍ය බෙදා දීමයි
4.පාත්‍ර බෙදා දීමයි 5.සෙනසුන් පැනවීමයි

22) කුසල් අකුසල් වර්ග කිරීමේදී කායික, වාචසික හා මානසික වශයෙන් ත්‍රිවිධද්වාරයෙන්ම පුද්ගලයා විසින් කුසල අකුසල කර්ම සිදු කරනු ලබන බව බෞද්ධ ඉගැන්වීමයි. ඒ අනුව කුසල් අකුසල ධර්මවල සඳහන් අභිධ්‍යාවෙන් බැහැර වීම,

1.කායික කුසලයකි. 2.මානසික කුසලයකි. 3.කායික හා මානසික කුසලයකි.
4.වාචසික කුසලයකි. 5.වාචසික හා කායික කුසලයකි.

23) තමා මෙන්ම අඹුදරුවන්, සේවක සේවකාදීන් සැපවත් කිරීම සඳහා ධනය පරිහරණය කළ යුතු බවට උපදෙස් ලබාදෙන සූත්‍ර දෙකකි.

1.කරණීය මෙත්ත සූත්‍රය හා මහාමංගල සූත්‍රය.
2.ව්‍යග්ඝ පජ්ජ සූත්‍රය හා ධම්මික සූත්‍රය.
3.සිගාලෝවාද සූත්‍රය හා අග්ගඤ්ඤ සූත්‍රය.
4.පත්ත කම්ම සූත්‍රය හා අපුත්තක සූත්‍රය.
5.වන රෝප සූත්‍රය හා මහා පරිනිබ්බාණ සූත්‍රය.

24) විවිධ ශික්ෂාපද සමාදන් වීමේදී ඒවායේ අනුපිළිවෙලක් ඇත. අෂ්ටාංග සීලයෙහි සිල් පද අටක් ඇත. එහි ඇතුලත් ''විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනු,

1.දෙවන ශික්ෂා පදයයි. 2.තුන්වන ශික්ෂා පදයයි. 3.හතරවන ශික්ෂා පදයයි.
4.පස්වන ශික්ෂා පදයයි. 5.හයවන ශික්ෂා පදයයි.

25 යම් පුද්ගලයෙකු නින්ද ප්‍රිය කරයිද, අලසකමින් යුක්තවේද, ක්‍රෝධ සහගත සිතුවිලි වලින් යුක්තවේද, ඔහු

1.සතර බ්‍රහ්ම විහරන අගය කරන්නෙකි.

2.අන්‍ය මතවාද නොඉවසන්නෙකි.

3.පරිහානිය පිළිබඳ නොසිතා කටයුතු කරන්නෙකි.

4.කුසල් අකුසල් පිළිබඳව කරුණු නොදන්නා කෙනෙකි.

5.සතර අගතියෙන් අගතිගාමී වූවෙකි.

26) දස පින් කිරියවත්වල සඳහන් ගුණ ධර්ම ඉතා මැනවින් ප්‍රගුණ කළ ඥානවතී මහත්මිය දිනපතා මිනිත්තු දහයක් භාවනා කිරීම සිදු කළාය. වාර්ෂිකව තම නිවසෙහි භික්ෂූන් වහන්සේ වැඩමවා දානමය පිංකමක් සිදු කිරීමත් ඉන්පසු මියගිය ඥාතීන්ට පින්දීමත් සිදු කළාය. සෑම වෙසක් පොහෝ දිනයකම සවස් වරුවේ විහාරස්ථානයේදී ධර්ම ශ්‍රවණය කරන ඇය ඉන් අනතුරුව විවිධ අයුරින් වතාවත් සිදු කරයි. රාත්‍රී නින්දට යාමට පෙර ආනාපාන සති භාවනාව වැඩීම ද ඇය තුල පැවති හොඳ සිරිතකි. මෙම ප්‍රකාශයෙහි ඇතුලත් පුණ්‍ය ක්‍රියා ගණන,

1.තුනකි. 2.හතරකි. 3.පහකි. 4.හයකි. 5.හතකි.

27) සිඟාලෝවාද සූත්‍රයට අනුව භෝග සම්පත් විනාශවන මුඛ හයකි. එහි සඳහන් ''සමජ්ජාභිචරණය'' යන්නෙන් අදහස් වන්නේ,

1.නොකල්හි වීථි සංචාරය කිරීමයි
2.දූ කෙළියෙහි යෙදීමයි
3.අලස බවින් යුක්තවීමයි
4.නාට්‍ය දර්ශන සඳහා යාමයි
5.පාප මිත්‍ර සේවනයෙහි යෙදීමයි

28) ''අත්තුපනායික ධර්මපර්යාය'' ලෙස හඳුන්වනු ලබන්නේ,

1.පරිපාලනය පිළිබඳ සිද්ධාන්තයකි

2.හොඳ නරක විනිශ්චය පිළිබඳ සිද්ධාන්තයකි

3.සම්පත් කළමණාකරණය පිළිබඳ සිද්ධාන්තයකි

4.නිවන් මග හා සම්බන්ධ සිද්ධාන්තයකි

5.භික්ෂූන්ට පමණක් අනුගමනය හැකි පිළිවෙතකි.

29) විවිධ සමාජ ගැටලු ඇති වීම කෙරෙහි පරිසර දූෂණය ද බලපානු ලබයි. බුදු දහම පරිසර හිතකාමී ආකල්ප රැසක් දේශනා කර ඇත.ඒ බව සනාථ කළ හැකි සූත්‍ර දේශනාවකි,

1.සිගාලෝවාද සූත්‍රය. 2.චංකී සූත්‍රය. 3.මහා මංගල සූත්‍රය.

4.උපාලි සූත්‍රය. 5.වනරෝප සූත්‍රය.

30) සිත මනාසේ පිහිටුවා ගැනීම මංගල කරුණකි. ඒ බව මහා මංගල සූත්‍රයෙහි සඳහන් කරන්නේ,

1.අත්ත සම්මා පණිධීච යනුවෙනි.

2.සුභාසිතාච යාවාචා යනුවෙනි.

3.අනාකුලාච කම්මන්තා යනුවෙනි.

4.ආරති විරති පාපා යනුවෙනි.

5.අරිය සච්චාන දස්සනං යනුවෙනි.

31) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ................ අතර අග තනතුර හොබවමින් ගමින් ගමට ගොස් ධර්ම ප්‍රචාරයෙහි නිරත වූහ.

1.ප්‍රඥාවන්තයින් 2.ධූතාංගධාරින් 3.සෘද්ධි මතුන්
4.ධර්ම කතිකයින් 5.විනයධරයන්

32) අනර්ථය සිදු කරන පදවලින් යුත් වචන දාහක් වුවත් උතුම් නැත.යමක් ඇසීමෙන් මිනිසා සංසිඳීමට පත්වේද? එබඳු එක අර්ථවත් පදය පවා උතුම්ය.යන අදහස දෙන ධම්ම පද ගාථාවේ මුල් පදය වන්නේ,

1.න අත්තහේතු න පරස්ස හේතු යන්නයි.
2.සහස්සමපි චේ වාචා ............ යන්නයි.
3.නපරේසං විලෝමානි ........... යන්නයි.
4.උට්ඨාන වතෝ සතිමතෝ ........... යන්නයි.
5.මධුවා මඤ්ඤතී බාලෝ ........... යන්නයි.

33) ''අල්පේච්ඡතාව'' යනුවෙන් අර්ථවත් වන්නේ,

1.බලාපොරොත්තු කිසිවක් නැති බවයි.
2.ලද පමණින් සතුටු වීමයි.
3.ගුණකරුක බව අගය කිරීමයි.
4.අඩු බලාපොරොත්තු ඇති බවයි.
5.පහසුවෙන් පෝෂණය කළ හැකි බවයි.

34) ප්‍රථම ධර්ම සංගීතිය පැවැත්වීමෙන් පසු විනය මෙන්ම ධර්මය ද මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ ධර්මධර සහ විනයධර මහ තෙරුන් ප්‍රධාන උන් වහන්සේලාගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරා වලට පැවරුනු අතර එහි දී මජ්ඣිම නිකාය භාර වූයේ ,

1.ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
2.අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
3.මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.
4.සියලුම මහතෙරුන් වහන්සේලාටයි.
5.සැරියුත් තෙරුන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරටයි.

35) පහත සඳහන් ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය තොරන්න.

1.ප්‍රථම ධර්ම සංගීතියේ මූලිකත්වය මහා කාශ්‍යප මහරහතන් වහන්සේය.
2.දෙවන ධර්ම සංගීතියේ මූලිකත්වය සබ්බකාමී මහරහතන් වහන්සේය.
3.ප්‍රථම ධර්ම සංගීතියට අජාසත්ත රජුගේ දායකත්වය ලැබුණි.
4.දෙවන ධර්ම සංගීතිය විශාලා මහනුවරදී පවත්වන ලදි.
5.මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ දෙවන ධර්ම සංගීතියේ සියලු සංවිධාන කටයුතු මෙහෙයවන ලදි.

36) වසුමිත්‍ර,පාර්ශ්ව,නාගර්ජුන,අශ්වඝෝෂ වැනි බෞද්ධ මහා පඬිවරු වාසය කළේ,

1.අශෝක අධිරාජයාගේ රාජ්‍ය සභාවේය.
2.කණිෂ්ක අධිරාජයාගේ රාජ්‍ය සභාවේය.
3.බිම්බිසාර අධිරාජයාගේ රාජ්‍ය සභාවේය.
4.කොසොල් අධිරාජයාගේ රාජ්‍ය සභාවේය.
5.උදේන අධිරාජයාගේ රාජ්‍ය සභාවේය.

37) උස් ගොඩනැගිල්ලක් මුදුනේ ආකාශ වස්තු පර්යේෂණාගාරයක් ද තවත් ගොඩනැගිල්ලක රසායනාගාරයක්ද ,වෛද්‍ය විද්‍යාලයක් සහ රෝගී නේවාසිකාගාරයක්ද තිබූ බව සඳහන් වන්නේ,

1.නාලන්දා විශ්ව විද්‍යාලයේය.
2.වික්‍රමශිලා විශ්ව විද්‍යාලයේය.
3.වලභි විශ්ව විද්‍යාලයේය.
4.ජගද්දලා විශ්ව විද්‍යාලයේය.
5.ඕදන්තපුර විශ්ව විද්‍යාලයේය.

38) පැරණි භාරතයෙහි විශිෂ්ට අධ්‍යාපන ආයතනයක් වූ වික්‍රමශිලා විශ්ව විද්‍යාලය තුළ විද්‍යා මණ්ඩපය භාරව සිටි ද්වාරපණ්ඩිතවරු වෙත පැවරී තිබූ ප්‍රධාන කාර්යය වූයේ,

1.විෂය නිර්දේශ සැකසීමයි.
2.නේවාසික සිසුන්ගේ පහසුකම් ගැන සොයා බැලීමයි.
3.ප්‍රවේශ පරීක්ෂණයකින් සිසුන් තෝරා ගැනීමයි.
4.විනය නීති සම්පාදනය කිරීමයි.
5.පරිපාලන කටයුතු සියල්ල මෙහෙයවීමයි.

39) මිනිස් ඝාතන නිසා දැඩි කම්පාවට පත් අශෝක දිග් විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙලඹුණ අයුරු සඳහන් වන ගිරි ලිපිය වන්නේ,

1. 7 වන ගිරි ලිපියයි.
2. 13 වන ගිරි ලිපියයි.
3. ගිරිනාර් 3 ගිරි ලිපියයි.
4. කාල්සි ගිරි ලිපියයි.
5. බරාබර් ගුහා ලිපියයි.

40) වලභි විශ්ව විද්‍යාලය තුළ අතිවිශාල පුස්තකාලයක් තිබූ බව සඳහන් වන අතර එම විශ්ව විද්‍යාලය සඳහා පුස්තකාලයයීය අරමුදලක් ද තිබූ බව ............ විසින් පිහිටුවන ලද සෙල්ලිපියක සඳහන් වේ.

1.ධර්මපාල රජතුමා
2.අශෝක රජතුමා
3.ගුහසේන රජතුමා
4.බුද්ධ ගුප්ත රජතුමා
5.තථාගත ගුප්ත රජතුමා

41) ප්‍රාග් බෞද්ධ ලංකාවේ පූජනීයත්වයට පත් දෙවිවරු අතර ලෝකුරුවන්ට අධිපති සේ සලකා ඇත්තේ ............ දෙවියන්ය.

1.කම්මාර 2.ව්‍යාධ 3.වෛශ්‍රවණ 4.උපුල්වන් 5.සුමන

42) පණ්ඩුකාභය රජු විසින් ජෝතිය ගිරි,කුම්භාණ්ඩ යන අය වෙනුවෙන් වාසස්ථාන ඉදි කරන ලද බව සඳහන් වේ. එයින් පැහැදිලි වන්නේ එවකට ලක්දිව,

1.ජෛන ආගම පැවති බවයි.
2.පරිබ්‍රාජක ආගම පැවති බවයි.
3.ජටිල ආගම පැවති බවයි.
4.බ්‍රාහ්මණ ආගම පැවති බවයි.
5.ආජීවක ආගම පැවති බවයි.

43) වජ්ජිපුත්තක භික්ෂූන් විසින් කැපයැයි පිළිපදින ලද ථේරවාදී භික්ෂූන් විසින් අකැපයැයි තීරණය කළ දස වස්තුවෙහි දැක්වෙන ''අදසක නිසීදන කප්ප'' යන්නෙහි අදහස නම්,

1.එක් ගමකින් ලබාගත් ආහාර තවත් ගමකට ගොස් වැළඳීම කැප බවයි.

2.එක් සීමාවක පිහිටි කුඩා කුඩා ආවාසවල වෙන වෙනම පොහොය කිරීම කැප බවයි.

3.තම ආචාර්ය පරම්පරාවෙන් එන චිරාගත දේ එලෙසින්ම කිරීම කැප බවයි.

4.නොපැසුණු සුරාපානය කැප බවයි.

5.වාටිය නොමැසූ ඇතිරිලි භාවිතය කැප බවයි.

44) සම්බුදු සසුනෙහි තෙවන ධර්මදූත කණ්ඩායම බවට පත් වන්නේ තුන්බෑ ජටිලයන් ඇතුළු පිරිසකි. නේරංජනා ගංතෙරට වැඩම කළ බුදු රජාණන් වහන්සේ තුන්බෑ ජටිලයන් ඇතුළු 1003 ක් වූ පිරිස ඒහි භික්ෂු භාවයෙන් පැවිදි කළ අතර ඒ සියලු භික්ෂූන් රහත් බවට පත් වූයේ,

1.ධම්සක් පැවතුම් සූත්‍රය ශ්‍රවණය කිරීමෙනි.

2.බ්‍රාහ්ම ජාල සූත්‍රය ශ්‍රවණය කිරීමෙනි.

3.ආදිත්ත පරියාය සූත්‍රය ශ්‍රවණය කිරීමෙනි.

4.අනන්ත ලක්ඛන සූත්‍රය ශ්‍රවණය කිරීමෙනි.

5.දේවදූත සූත්‍රය ශ්‍රවණය කිරීමෙනි.

45) ධර්මාශෝක රාජ්‍ය සමයේ දී භික්ෂූන් වහන්සේලා වසර හතක් පමණ විනය කර්ම කිරීමෙන් වැළකී සිටි බවත් මොග්ගලීපුත්ත තිස්ස තෙරුන්ද අනෝමා ගංගා තීරයට ගොස් හුදකලාව වැඩ සිටි බවත් මූලාශ්‍රවල සඳහන් වේ. එසේ වීමට හේතු වූයේ ,

1.රාජ්‍ය අනුග්‍රහය නොලැබීමයි.

2.භික්ෂූන් හිතුවක්කාර තීරණ ගැනීමයි.

3.සීමාමාලක නොමැතිවීමයි.

4.දුස්සීල භික්ෂූන් බහුල වීමයි.

5.ආගමික ගැටුම් ඇති වීමයි.

46) තෙවන ධර්ම සංගායනාවේ යහපත් ප්‍රතිඵලයක් ලෙස නව රට සසුන් පිහිටුවීම අගය කළ හැකිය. ඒ අනුව මහා රක්ඛිත තෙරුන් කාලකාරාම සූත්‍රයෙන් බුදු දහම හඳුන්වා දුන්නේ ,

1.ස්වර්ණ භූමියටයි. 2.අපරන්ත දේශයටයි. 3.මහිස මණ්ඩලයටයි.
4.වනවාසි දේශයටයි. 5.යෝනක දේශයටයි.

47) කාශ්මීරයේ කුණ්ඩල වන විහාරයේදී පවත්වන ලද සර්වාස්තිවාදී ධර්ම සංගීතියේ ප්‍රධානත්වය උසුලන ලද්දේ ,

1.පාර්ශ්ව තෙරුන්ය. 2.නාගර්ජුන තෙරුන්ය. 3.වසුමිත්‍ර තෙරුන්ය.
4.උපගුප්ත තෙරුන්ය. 5.අශ්වඝෝෂ තෙරුන්ය.

48) මහින්දාගමනයෙන් පසු ලක්දිව බෞද්ධ රාජ්‍යයක් බවට පත්විය. ඒ නිසාම රජවරුන්ට උපදෙස් දීම සඳහා භික්ෂූන් වහන්සේලා පත්කර ගනු ලැබීය. එලෙස දුටුගැමුණු රජුගේ අනුශාසක තෙරුන් ලෙස පත්වී සිටියේ ,

1.මිහිඳු මා හිමියන්ය.
2.ගෝධගත්ත තිස්ස තෙරුන්ය.
3.කුපික්කල තිස්ස තෙරුන්ය.
4.මහා නාග තෙරුන්ය.
5.සංඝමිත්‍ර තෙරුන්ය.

49) ''ලංකාවේ රාජ්‍ය පාලකයා බෞද්ධයකු පමණක් නොව බෝධිසත්ත්වයකුද විය යුතුය'' යන්න සෙල්ලිපියක සඳහන් කළ ලක්දිව බෞද්ධ පාලකයා වූයේය.

1.දෙවන පැතිස් රජුය. 2.මහසෙන් රජුය. 3.දුටු ගැමුණු රජුය.
4.ධාතුසේන රජුය. 5.04 වන මිහිඳු රජුය.

50) මහින්දාගමනයෙන් පසු ලක්දිව ඉදිකළ මුල්ම ස්තූපය ථූපාරාමයයි. දෙවන පැතිස් රජු විසින් ඉදිකරවන ලද එම දාගැබෙහි තැන්පත් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,

1.දකුණු අකු ධාතුන් වහන්සේය.
2.වම් අකු ධාතුන් වහන්සේය.
3.ලලාට ධාතුන් වහන්සේය.
4.ග්‍රීවාධාතුන් වහන්සේය.
5.කේස ධාතුන් වහන්සේය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු**

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**

**Buddhist Civilization - II**

45 | S | II

පැය 03 යි

**Time: 03 hours**

අමතර කියවීම් කාලය මිනි : 10 කි

උපදෙස්

* I කොටසින් **ප්‍රශ්න දෙකක්** ද II කොටසින් **ප්‍රශ්න තුනක්** ද තෝරාගෙන **ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකටම ලකුණු 20කි. (1)(2)(3) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 4 බැගින්ද (4)(5)(6)(7)(8) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගින්ද හිමි වේ.

## I කොටස

(1) i භාරතය තුළ ආර්ය අනාර්ය භේදය ඇති වූ ආකාරය පෙන්වා දෙන්න.

ii බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව ක්ෂත්‍රිය වර්ණයට අයත් වූ ස්වධර්මය නම් කරන්න.

iii චතුර්විධ ආශ්‍රම ධර්ම හඳුන්වා දෙන්න.

iv පූර්ණ කාස්සප ශාස්තෘවරයාගේ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

v අකිරියවාදය පිළිබඳව බුදු සමයේ ආකල්පය සැකෙවින් ඉදිරිපත් කරන්න.

(2) i සම්මා සම්බුද්ධ බුදු ගුණය හඳුන්වන්න.

ii තාදී බුදු ගුණයෙන් ලැබිය හැකි ආදර්ශයන් කෙටියෙන් ඉදිරිපත් කරන්න.

iii සිගාලෝවාද සූත්‍රයේ සඳහන් අයුරින් දෙමාපියන් හා දරුවන් අතර පැවති ය යුතු යුතුකම් නම් කරන්න.

iv ප්‍රජාපතී ගෝතමීය සතුව පැවති ගුණාංග හතරක් හඳුන්වා දෙන්න.

v කාන්තාව උපාසිකාවක් ලෙස හා භික්ෂුණියක් ලෙස බුදු සමයෙන් ඇගයීමට ලක් වූ ආකාරය ගෙන හැර දක්වන්න.

(3) i දස රාජධර්ම නම් කරන්න.

ii ''සුකරානි අසාධූනි'' ............ යන ගාථාව සම්පූර්ණ කරන්න.

iii එම ගාථාවේ අර්ථය නිවැරදිව ලියන්න.

iv ''සුභාසිතාව යා වාචා'' ............ යන්න ට කෙටි විවරණයක් සපයන්න.

v සිගාලෝවාද සූත්‍රයට අනුව ''නොකල්හි වීදි සංචාරයේ '' ආදීනව පෙන්වා දෙන්න.

## II කොටස

(4) i "බෞද්ධ දේශපාලන මූලධර්ම සකස් වී ඇත්තේ දැහැමි රාජ්‍යයක් ගොඩනැගීම සඳහාය." මෙම කියමන පිළිබඳ විමර්ශනයක් කරන්න.

ii භෞතික සම්පත් කළමනාකරණයට අදාල බෞද්ධ ඉගැන්වීම් වත්මන් සමාජයට ආදර්ශයක් කර ගත හැකි දැයි පරීක්ෂා කරන්න.

(5) i ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ සංකල්පය ස්වාර්ථය මෙන්ම පරාර්ථය අරමුණු කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

ii චතුර්විධ සුඛ සංකල්පය සැනසිලිදායී ගෘහ ජීවිතයක් සඳහා උපයෝගී කරගත හැකි ආකාරය විස්තර කරන්න.

(6) i වර්තමානයේ පවතින පාරිසරික ගැටලු අවම කිරීම සඳහා පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කරගත හැකි දැයි විමර්ශනය කරන්න.

ii විවේකය අර්ථ සම්පන්නව ගත කිරීම සඳහා බුදු දහමින් නිර්දේශිත ක්‍රියාමාර්ග මොනවාදැයි විස්තර කරන්න.

(7) i ධර්මාශෝක අධිරාජයාගේ ශාසනික මෙහෙවර උදාහරණ සහිතව අගය කරන්න.

ii නාලන්දා විශ්ව විද්‍යාලය පිළිබඳව විධිමත් විමර්ශනයක් කරන්න.

(8) i ධර්ම සංගායනාවක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි හඳුන්වා බුදුරදුන් ජීවමාන සමයේදීම ධර්ම සංගීතියක අවශ්‍යතාවක් පැන නැගුනේ දැයි පරීක්ෂා කරන්න.

ii ප්‍රථම ධර්ම සංගිතීයෙහි ප්‍රතිඵල ශාසන චිරස්ථිතිය පිණිස හේතු වූ ආකාරය සාකච්ඡා කරන්න.

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය**

**දෙවන වාර පරීක්ෂණය 2020 මාර්තු**

**බෞද්ධ ශිෂ්ටාචාරය**

**Buddhist Civilization**

13 ශ්‍රේණිය

| 45 | S | 1 |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

**I පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 5 | (11) | 4 | (21) | 1 | (31) | 2 | (41) | 1 |
| (2) | 3 | (12) | 2 | (22) | 2 | (32) | 2 | (42) | 1 |
| (3) | 4 | (13) | 1 | (23) | 4 | (33) | 4 | (43) | 5 |
| (4) | 2 | (14) | 3 | (24) | 5 | (34) | 5 | (44) | 3 |
| (5) | 1 | (15) | 4 | (25) | 3 | (35) | 5 | (45) | 4 |
| (6) | 2 | (16) | 5 | (26) | 3 | (36) | 2 | (46) | 5 |
| (7) | 4 | (17) | 2 | (27) | 4 | (37) | 1 | (47) | 1 |
| (8) | 3 | (18) | 4 | (28) | 2 | (38) | 3 | (48) | 2 |
| (9) | 5 | (19) | 3 | (29) | 5 | (39) | 4 | (49) | 5 |
| (10) | 1 | (20) | 3 | (30) | 1 | (40) | 3 | (50) | 1 |

( ලකුණු 2 x 50 = 100 )

**II පත්‍රය**

(1) i

* ඉන්දු වෛරාණීය නමින් හැඳින්වෙන ජනයාගෙන් කොටසක් ඉරානයෙන් බටහිර භාරතයට ,සංක්‍රමණය වී ඉන්දු නිම්න මිටියාවත්වල ජනාවාස ගොඩනගා ගැනීම.
* බුද්ධිමත් ,වර්ණවත් ආරෝහ පරිනාහ දේහයකින් යුක්ත වූ ඔවුන් යුද්ධයෙහි ජනකාමීන් වූ බව
* භාරතයට පැමිණ ආර්ය ජනයා ස්වදේශිකයන්ගේ නායකයන් මරා දමා ආර්ය ජනවාසවල වහලුන් බවට පත් කර ගැනීම.
* ස්වදේශිය මුල් පදිංචිකරුවන් කාළවර්ණ සමෙන් යුක්තව ඉන්දු නිම්නයෙන් ජනාවාස ගොඩනගා ගෙන සිටි අතර ඔවුන් අනාර්යන් ලෙස හඳුන්වා ඇත.

ii

* ප්‍රජා රක්ෂණය,දන්දීම,යාග කිරීම,ඉගෙනීම,කාමයෙහි නොඇලී සිටීම.

iii

* චතුර්විධ ආශ්‍රම ධර්ම නම් පුද්ගල ජීවිතය අවධි හතරකට බෙදා දැක්වීමයි.
* බ්‍රාහ්මාරි,ගෘහස්ථ,වානප්‍රස්ථ,සන්‍යාසී.
* බ්‍රාහ්මචාරී :- ශිෂ්‍යයකු ලෙස ඉගෙනගන්නා කාලයයි. වේද හා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමේ කාලයයි.
* ගෘහස්ථ :- විවාහ ජීවිතයට ඇතුළත්ව අඹුදරුවන් පෝෂණය කිරීම හා පස්කම් සුව අනුභව කරමින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීම.පිරිමි පුතකු බිහිකිරීම අනිවාර්යය විය.
* වාන ප්‍රස්ථ :- වනගත වී තවුස්දම් රැකීමේ කාලයයි.සිය අභිමතය පරිදි බිරිඳ කැටිව යා හැකිය.
* සන්‍යාසි :- බ්‍රහ්ම සහව්‍යතාවය අපේක්ෂාවෙන් අනගාරිකව,හුදකලාව,සංචාරකව පූජක ජීවිතයක් ගත
* කළ යුතුය.යෝගී භාවනා වල නිරත විය.

iv

* සාමඤ්ඤඵල සූත්‍රය පදනම් කරගෙන පිළිතුර සකස් විය යුතුය.
* පූර්ණ කාශ්‍යප අකිරියවාදියෙකි.භෞතිකවාදියෙකි.කරන්නෙකු ,කරවන්නෙකු,සිඳින්නකු,සිඳවන්නකු නැතැයි යන දර්ශනය අකිරියවාදයයි.
* සමස්ථ පෘතුවියේ සියලු ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කරද ඒ හේතුවෙන් උපදිනා පාපයක් නැතැයි උගන්වයි.(නත්ථි පාපස්ස ආගමෝ )
* දන් දෙමින් ,දන් දෙවමින් ,යදිමින් ,යදවමින් ගංගා තීරයේ උතුරු කෙළවර තෙක් ගියත් එයින් පිනක් නැති බව ඔහු උගන්වා ඇත.(නත්ථි පාපස්ස ආගමෝ)

v

* බුදු දහම කිරියවාදීය සචේතනික ක්‍රියාවේ වගකීම කරන්නා විසින්ම දැරිය යුතු බව අවධාරණය කරයි.
* අත්තනාව කතං පාපං - අත්තනාසං කිලිස්සසති
  අත්තනා අතකං පාපං - අත්තනාව විසුජ්ඣති
* ලෝභ ,දේස ,මෝහ ,චේතනා මුල් අකුසල් කරයි.අලෝභ ,අදෝස ,අමෝහ චේතනා පෙරදැරිව කුසල් කරයි.
* සචේතනිකව කරනු ලබන පින් පව් ,කුසල් අකුසල් වල විපාක එම පුද්ගලයාටම දිට්ඨදම්මවේදනීය,උපපජ්ජවේදීය,අපරාපරියවේදනීය වශයෙන් මෙලොවදී හෝ මතු භවයකදී හෝ විපාක දීමට ඉදිරිපත් වන බව බෞද්ධ මතයයි.
* දන් දීම ඉඳුරන් දමනය ,සිල් රැකීම වැනි ක්‍රියා මෙලොව, පරලොව ජීවිතසුවපත් කිරීමටත් සසර දුක් කෙළවර කිරීමටත් හේතුවන බව සඳහන් කරන බුදු සමය එම ක්‍රියා සදාචාරවත් සත් ක්‍රියාවක් ලෙස දක්වයි.

2 i

* මැනවින් තමාව අවබෝධ කළේය.අවබෝධ කරයි.අවබෝධ කරන්නේය.යන අර්ථයෙන් බුදු රජාණනන් වහන්සේ සම්මා සම්බුද්ධ නමින් හඳුන්වයි.
* දැනගත යුතු සියල්ල දැනගෙන අවබෝධ කළ බැවින්ද සාක්ෂාත් කළ යුතු සියලු ධර්ම සාක්ෂාත් කළ බැවින්ද වැඩිය යුතු සියලු ධර්ම වැඩු බැවින්ද ප්‍රහීන කළ යුතු සියලු ධර්ම ප්‍රහීන කළ බැවින්ද බුද්ධ නම් වන අතර ඒ සියල්ල තමා විසින් අවබෝධ කර බැවින් සම්මා සම්බුද්ධ නම් වේ.

ii

* ලාභ ,අලාභ ,යස ,අයස, නින්දා, ප්‍රශංසා, සැප, දුක් යන අටලෝ දහම ඉදිරියේ නොසැලී සිටීම තාදී ගුණයයි.
* අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණකි.
* අක්කෝසක භාරද්වාජ ,දේවදත්ත තෙරුන් ,සුන්දරී පරිබ්‍රාජිකාව,චිංචිමානිකාව යන චරිත හා සම්බන්ධ සිදුවීම් වලදීද,ජේතවනාරාමය,පූර්වාරාමය ආදී පුජා සත්කාර හමුවේදී ද වේරඤ්ජා වස් කාලය වැනි කටුක අවස්ථාවලදී බුදුරදුන් ඉවසීමෙන් හා උපේක්ෂාවෙන් කටයුතු කළහ.
* ගිහි පැවිදි සියලු දෙනාටම සමාජය තුළ විවිධ ගැටලු ඇති වීම ස්වභාවිකය.ඒවාට මුහුණ දී මේදී අකම්පිතව හා සිහි නුවණින් ක්‍රියා කිරීම වැදගත්ය.

* ඉවසීම,සංවරශිලි වීම,නොබියව කටයුතු කිරීම යථාර්ථයෙන් පලා නොයෑම උපේක්ෂා සහගත වීම මානසික බිඳවැටීම වලක්වා ගැනීම වැනි ධනාත්මක ආකල්ප සංවර්ධනය කර ගැනිමට තාදී ගුණයෙන් ආදර්ශ ගත ඇකිය.

iii

| දෙමාපිය යුතුකම් :- | දූ දරුවන්ගේ යුතුකම් :- |
|---|---|
| 1. පවින් වැලැක්වීම | 1. දෙමාපියන් පෝෂණය කිරීම. |
| 2. යහපතෙහි යෙදවීම. | 2. දෙමාපියන්ගේ කටයුතු කරදීම. |
| 3. ශිල්ප ඉගැන්වීම. | 3. කුල පරපුර රැකගැනීම. |
| 4. සුදුසු කල්හි විවාහ කරදීම. | 4. මව්පියන් සතු දායාද රැකීම. |
| 5. සුදුසු කල්හි දායාද පවරාදීම. | 5. මියගිය දෙමාපියන්ට බන් දීම. |

iv

* මවු ගුණය

සිදුහත් කුමරු ,නන්ද කුමරු, නන්දා කුමරිය, රාහුල කුමරු යන සියලු දෙනාට එකම අයුරින් මවු සෙනෙහස දක්වා ඇත.

අගනා සිවුරු දෙකක් සියතින්ම නිමවා බුදුරජාණන් වහන්සේට පූජා කිරීමට ඉදිරිපත් වූයේ අපරිමිත ගෞරවයක් බුදුරදුන් කෙරෙහි තිබූ බැවිනි.

* පරිත්‍යාගශිලී බව :-

මහාමායා දේවිය කලුරිය කළ පසු සුද්ධෝදන රජුගේ අග බිසව ලෙස ක්‍රියාකිරීම.
සියලු රජ සැප  අත්හැර කාන්තාවන්ට පැවිද්ද ලබා ගැනීම සඳහා ක්‍රියාකිරීම.

* ඉවසීම :-

නන්ද කුමරු හා රාහුල කුමරු පැවිදි වීමෙන්ද
සුද්ධෝදන රජු මිය යෑමෙන් ද හුදකලා වූ ඇය සියල්ල ඉවසා දරා සිටියේය.

* නිහතමානී බව

චිරරාත්‍රඥ භික්ෂුණින් අතරඅගතනතුර ලැබුවද ඇය නිහතමාවී විය.
පිරිනිවන් පෑමට අවසර ලැබීමට පැමිණි අවස්ථාවේ වරදක් වී ඇත්නම් සමාවන්නැයි බුදුරදුන්ගෙන් ඉල්ලා සිටීම.
අෂ්ට ගරු ධර්ම ඉතා ගෞරවයෙන් පිළිගැනීම.

* චාම් බව :- ක්ෂත්‍රිය කුලයේ ප්‍රමුඛතම කාන්තාවක් වුවද හැම විට චාම් බව අගය කළේය.
* උත්සාහය හා අධිෂ්ඨානය

කිඹුල්වත් නුවර දී තෙවරක් ඉල්ලා නොලැබුණු පැවිද්ද ලබා ගැනීමට ඇවිත් අධිෂ්ඨාන කිරීම. විශාලා මහනුවර කුටාගාර ශාලාවේදී ආනන්ද හිමියන්ගේද උපකාර ඇතිව කාන්තාවන්ට පැවිදි බිමට අවස්ථාව ලබා ගැනීම.

v

* උපාසිකාවක් ලෙස ඇසීමට ලක් වූ ආකාරය විශාඛාව අග්‍ර දායිකාව,ඛුජ්ජුත්තරා දායිකාව බහුශ්‍රැත දායිකාවන් අතර අග්‍ර නකුලමාතා, විශ්වාසවන්ත කතා ඇත්තියන් අතර අග්‍ර , සුප්පාවාස ප්‍රනීත ආහාර දෙන්නියන් අතර අග්‍ර, සාමාවතී මෙත්තා විහාරි උපාසිකාවන් අතර අග්‍ර ආදී තනතුරු ලැබීමෙන් පෙනේ.
* ප්‍රජාපතී ගෝතමී තෙරණිය - චිරරාත්‍රඥා භික්ෂුණින් අතර අග්‍ර
ඛේමා තෙරණිය - නුවණැති භික්ෂුණින් අතර අග්‍ර
උප්පලවණ්ණා තෙරණිය - සෘද්ධිමත් භික්ෂුණින් අතර අග්‍ර

පටාචාරා තෙරණිය - විනයධර භික්ෂුණීන් අතර අග්‍ර
සකුලා තෙරණිය - දිවැස් ඇති භික්ෂුණීන් අතර අග්‍ර

* මෙවැනි තනතුරු ලැබීමට හා විමුක්තිය ලැබීමට හැකි වූයේ බුදු දහමින් ඇගයීමට ලක් වූ බැවිනි.

3 i දානය,සීලය,පරිත්‍යාගය,ඍජුබව,මෘදු බව,තපස,අක්‍රෝධය,අවිහිංසාව,ඉවසීම,අවිරෝධතාවය

ii සුකරානි අසාධූනි - අත්තනා අහිතානිච

යංවේ හිතංච සාධුංච - තංවේ පරමදුක්කරං

iii තමාට අහිතවූ අයහපත් දේ ලෙහෙසියෙන් කරගත හැකිය.යම් දෙයක් තමාට හිත හෝ යහපත් හෝ

වේනම් එය කිරීම ඒකාන්තයෙන් ඉතා අමාරුය.

iv

* සුභාසිතාච යාවාචා යනු මංගල කරුණකි.
* යහපත් වචන කතා කිරීමයි.
* බොරුකීම,කේලාම් කීම,හිස් වචන කීම,පරුෂ වචන කීම යන වැරදි වලින් වැලකී යහපත් වචන කතා කිරීමයි.
* අංගුත්තර නිකායේ තික නිපාතයේ වචන කතා කිරීම ත්‍රිවිධාකාරව දක්වයි.
  1.ගූථභාණි :- දුගඳ හමන පිළිකුල් වචන කීමයි.
  2.පුප්ඵභාණි :- මල්මෙන් සුවඳ හමන ප්‍රිය වචන කීමයි.
  3.මධුභාණි :- මී පැණි බඳු මිහිරි වදන් කීමයි.

* ශිෂ්ට වූත් ප්‍රිය මනාප වූත්,ප්‍රේමණීය වූත් ,කණට මිහිරි වූත් ,හෘදයාංගම වූත් වචන භාවිතය ඉතා වැදගත්ය.
* බුදුරදුන් සමග වාදයට පැමිණි අයත්,අනාගාමික යනුත් ,උන්වහන්සේගේ කර්ණ රසායන මිහිරි වදන් ඉදිරියේ දමනය වී ඇත.

v සිඟා ලෝවාද සූත්‍රයට අනුව නොකල්හි වීථි සංචාරයේ ආදීනව හයකි.

1.තමාට ආරක්ෂාව නැතව යයි.

2.තම අඹුදරුවන්ට ආරක්ෂාව නැතිවෙයි.

3.තම වස්තුවට ආරක්ෂාව නැතිවෙයි.

4.අභූත චෝදනාවලට ලක්වෙයි.

5.කටකතා පැතිරේ.

6.බොහෝ දුක් කරදරවලට ගොදුරු වෙයි.

## II කොටස

4 i දස රජ ධර්ම,දස සක්විතිවත්,සතර සංග්‍රහ වස්තු සප්ත අපරිහානිය ධර්ම ,සතර අගති විරතිය ,පංචසීල ප්‍රතිපදාව යනාදී බෞද්ධ දේශපාලන මූලධර්ම තුළින් දැහැමි රාජ්‍යයක් ගොඩනැගෙන අයුරු පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.

ii

* භෞතික සම්පත් හා මානව සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව කළමණාකරනය කිරීම වැදගත්ය.
* ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේ සමජීවිකතා තුළින්ද පැහැදිලි කළමණාකරනයක් පෙන්නුම් කරයි.
* අය වැය තුලනය කරමින් ජීවිතය ජය ගැනීමට එමගින් මග පෙන්වයි.
* සිඟාලෝවද සූත්‍රයේ ආර්ථික කළමණාකරනයට හොඳ මග පෙන්වීමක් කරයි.(ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය)
* චුල්ලවග්ග පාලියේ, වත්තක්ඛන්ධයේ,ආගන්තුකවත ආවාසිකවත,සේනාසන වත වච්චකුටි වත ආදී වත් ආරමික ජීවිතය සඳහා හඳුන්වා දුන්නද ඒවා වර්තමානයේ ගිහි සමාජයටද ආදර්ශයක් කරගත හැකිය.

* සංඝ සංස්ථාවට ලැබෙන සියලු සම්පත් ප්‍රජාතන්ත්‍රවාදීව පරිහරණය කිරීමට තනතුරු රැසක් ඇති කළ බව.සේනාසන ගහාපක ,භත්තුද්දේසක,භාණ්ඩාගාරික,චීවර පටිග්ගාහක,යාගුභාජක,ඵලභාජක ආදී තනතුරු වලින් පෙනේ.
* වර්තමානයේ පොදු සම්පත් ලෙස සලකන පාසල,රෝහල,දුම්රිය,බස්රිය,විදුලිය,ජලය ආදීය භාවිතයේදී සම්පත් කළමණාකරනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ආදර්ශයක් කර ගත හැකිය.

5 i

* බෞද්ධ ඉගැන්වීමට අනුව ධනය ගොඩගසා ගත යුත්තක් නොව සංසරනය විය යුත්තකි.
* උපයන ධනය තමාගේ ප්‍රයෝජනය සඳහත් දෙමාපියන් පිනවීම දැයි දසුන් පිනවීම.මෙන්ම පැවිදි උතුමන්ය දීම සඳහාත් විය යුතුය.
* පත්ත කම්ම සූත්‍රයේ සඳහන් පංචබලි යුතුකම් සඳහාත් සිගාලෝවාද සූත්‍රයේ සඳහන් යුතුකම් ඉටුකිරීම සඳහන් ධනය යෙදවිය යුතුය.
* පරිභෝජනය,ආයෝජනය හා සංරක්ෂණය යන කරුණු සඳහා ධනය සැලසුම් කළ යුතු බව සිගාලෝවාද සූත්‍රයේ ''ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය........'' යනාදී ගාථාවෙන් පැහැදිලි කරයි.
* ධන විනාශයට හේතුවන අපාය මුඛ සඳහා ධනය නොයෙද වීමෙන් ද ස්වාර්ථය හා පරාර්ථය ධනාත්මක කළ හැකිය.

ii

* අත්ථි සුඛ,භෝග සුඛ,අනන සුඛ,අනවජ්ජ සුඛ යන චතුර් විධ සුඛ මඟින් පෙන්වන්නේ ගිහියකුගේ මෙලොව සැප සාධනයයි.
* එම කරුණු තුළින් ගෘහ ජීවිතය සැනසිලිදායක මෙන්ම සැපවත්වන ආකාරය විස්තර විය යුතුය.

6 i

* ජෛව ගෝලය, වායු ගෝලය, ජල ගෝලය සහ පාංශු ගෝලය පරිසරය ලෙස සලකයි.
* වර්තමානයේ පාරිසරික ගැටලු අතර ජල දූෂණය,වායු දූෂණය,වන විනාශය,කැලි කසල ගොඩ ගැසීම,පොලිතීන් භාවිතය ආදිය නිසා ජීවන දුෂ්කරතා මතු වී ඇත.
* ප්‍රමාණවත් පිරිසිදු ජලය නොමැති වීමද විවිධ ගැටලු සඳහා හේතු වී ඇත.
* පරිසර සංරක්ෂණය සඳහා මිනිසා යොමු කිරීමට බුදුරදුන් ක්‍රියා කළහ.
* රමණීයානි අරඤ්ඤානි.......
* නේරංජනා නදි තීරය වර්ණනා කර ඇත.
* ජලයට මුත්‍රා කිරීම,කෙළ ගැසීම,මළපහ කිරීම තහනම් කළ අයුරු පාචිත්තිය පාලියෙන් පෙනේ.
* ගස් කැපීම,බීජ විනාශය කිරීම, කොළ කැඩීම ආදිය උපසම්පදා භික්ෂූන්ට තහනම් කර ඇත.(පාචිත්තනීය පාලිය)
* මිනිස් ජීවිතය මෙන්ම,සියලු සත්ත්ව ජීවීතවල ජීවත් වීමේ අයිතිය සහතික කිරීම පංච සිලයෙන් මෙන්ම මෛත්‍රී භාවනා වෙන්ද සිදුකර ඇත.
* පරිසරය සංරක්ෂණය පින් වැඩෙන කුසල් ලෙස දක්වා ඇත.(ආරාමරෝපා,වනරෝප සූත්‍රය)
* නොකළ යුතු වෙළඳම් කිරීම ඍජුවම හා වක්‍ර ලෙස පරිසර සංරක්ෂණයට බාධා කරයි.
* බුද්ධ චරිතයෙන් බොහෝ සිදුවීම් සම්බන්ධවයි.

(ලකුණු 10 යි.)

ii

* ආගමික උත්සව පැවැත්වීම.
* පිරිත් දේශනා ධර්ම දේශනා පැවැත්වීම.
* පෙරහැර පැවැත්වීම,වන්දනා ගමන් යාම.
* මාර්ග ඉදි කිරීම,පැල සිටුවීම,දුගී,මගී,ජනයාට උපකාර කිරීම ආදී සුභසාධක කටයුතු සඳහා දායක වීම.
* විවේකීව භාවනා කිරීම.
* චිත්‍ර,මූර්ති,කැටයම්,නාට්‍ය වැනි කලා නිර්මාණ කිරීම.
* ධර්ම සාකච්ඡා පැවැත්වීම,දහම් පොත් රචනා කිරීම.ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවල ගැලපෙන වැඩසටහන් නැරඹීම,ගිලානෝපස්ථානය වැනි කටයුතු ද විවේකය අර්ථාන්විත කිරීම සඳහා යොදා ගත හැකිය.

7 i

* දුසිල් භික්ෂූන් 60,000 ක් සසුනෙන් නෙරපා දමා භේද භින්න වී සිටි භික්ෂූන් සමඟි කරවා ශාසන සංශෝධනයක් කරවා තුන්වන ධර්ම සංගීතියට අනුග්‍රහය දැක්වීම.
* භාරතයේ විවිධ ප්‍රදේශවලට හා විදේශිය වශයෙන් ද ධර්මය ව්‍යාප්ත කිරීමට දායක වීම.
* මහා වංශය හා සමන්තපාසාදිකාවේ සඳහන් පරිදි වෙහෙර විහාර රාශියක් ඉදිකිරීම.
* සාංචි ස්තූපය ගොඩනැගීම.
  සෙල්ලිපි,පුවරු ලිපි,ටැම් ලිපි ආදිය මඟින් මෙන්ම ධර්ම මහා මාත්‍යවරු මඟින් බෞද්ධ ඉගැන්වීම් ප්‍රසිද්ධ කිරීම.
* තම පුත් මිහිඳු කුමරු හා දියණිය සංඝමිත්තා ශාසන ගත කොට ධර්ම ප්‍රචාරය සඳහා යොමු කිරීම.
* කථාවත්ථුප්පකරනය රචනා කිරීම සඳහා මොග්ගලී පුත්ත තිස්ස හිමියන්ට පහසුකම් සැලසීම.
* ලුම්බිණිය සාරානාත් වැනි බුද්ධ චරිතය හා සම්බන්ධ වැදගත් ස්ථාන වන්දනාකර එම ස්ථානවල දියුණුවට අශෝක ස්ථම්භ පිහිටුවීම.
* ලුම්බිණිය අය බද්දෙන් නිදහස් කිරීම.
* පංචසීල ප්‍රතිපත්තිය,ආරෝග්‍යශාලා ඉදි කිරීම.මල්වතු උයන් වතු ඉදිකිරීම ආදි කටයුතු මඟින් ධර්මාශෝක අධිරාජයා සිදු කළ ආගමික මෙහෙවර විස්තර විය යුතුය.

(ලකුණු 10 යි)

ii

* ක්‍රි.ව. 415 - 455 රජකළ ශක්‍රා දිත්‍ය හෙවත් කුමාරගුප්ත රජු නාලන්දාව මහා විහාරය ආරම්භ කිරීම.
* බුද්ධ ගුප්ත,තථාගත ගුප්ත,බාලාදිත්‍ය වැනි ගුප්ත රජවරුන්ද නාලන්දාවේ සංවර්ධනයට දායක විය.
* දහවැනි සියවස වන විට ආචාර්ය මණ්ඩලය,ශිෂ්‍ය,කාර්ය මණ්ඩල සාමාජිකයන් දස දහසකට නේවාසික පහසුකම් පැවතියේය.
* ආචාර්යවරු 1500 ක් පමණ සිටීම.
* මූලික විෂය ධාරා පහකි.
  1.භාෂා විෂය ධාරාව.
  2.දර්ශන විෂය ධාරාව.
  3.බුද්ධ ධර්මය අධ්‍යාපන විෂය ධාරාව.
  4.ලෞකික අධ්‍යාපන විෂය ධාරාව.
  5.ලලිත කලා අධ්‍යාපන විෂය ධාරාව.

* අයදුම් ක්‍රමය ලෙස,දේශන ක්‍රමය,විවාද ක්‍රමය,හා පෞද්ගලික සාකච්ඡා ක්‍රමය භාවිතා කළේය.
* රත්නෝදය,රත්න සාගර,රත්නරඤ්ජන යන නම් වලින් හැඳින්වූ තට්ටු නවයකින් හා මන්දිර තුනකින් යුත් පුස්තකාලයක් පැවතීම.
* අධ්‍යාපන අංශ තුනක් යටතේ පැවතීම.
* පශ්චාත් උපාධි ලැබීමට පැමිණි සිසු පිරිස.
* ද්විතීයික අධ්‍යාපනය අවසන් කොට ප්‍රථම උපාධිය ලැබීමට පැමිණි සිසු පිරිස.
* ද්විතීයික අධ්‍යාපනය සඳහා නාලන්දාවට ඇතුළත්වන සිසුන් පිරිස.
* ද්වාර පණ්ඩිතවරු මඟින් ප්‍රවේශ විභාගය පවත්වා සිසුන් ඇතුළත් කිරීම.
* සෑම සිසුවකුටම පෞද්ගලික ගුරුවරයෙක් සිටීම.
* භාවනාව අනිවාර්ය විෂයක් විය.
* නාගර්ජුන ආර්යදේව,රාහුල භද්‍ර අසංග,වසුබන්ධු,ගුණමතී ස්ථිරමති ජයදේව ධර්මපාල,ශීල භද්‍ර,බුද්ධ කීර්ති ආදී හිමිවරුන් කීර්තිමත් කුලපතිවරු ලෙස ප්‍රකට විය.
* කුලපති හිමියන් යටතේ ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් මඟින් විශ්ව විද්‍යාලයේ සමස්ථ අධ්‍යාපන පරිපාලනය හා කළමනාකරණය සිදු විය.

8 i

* ධර්ම සංගායනාවක් යනු, ශාසනාභිවෘද්ධිකාමී මහා තෙරවරුන් විසින් බුද්ධ වචනය ඒකරාශි කර සදොස් තැන් වෙතොත් නිදොස් කර කාලීනව උද්ගත වන ගැටලු ධර්ම විනයට අනුව විසර්ජනය කර සජ්ඣායනා කොට අවශ්‍යතා ඇති වුවහොත් ශාසන ශෝධනයක් ද කිරීම සඳහා පවත්වනු ලබන ශාසනික කාර්යයකි.
* බුදුරදුන් ජීවමාන සමයේදීම ධර්ම සංගායනාවක අවශ්‍යතාවක් පැන නැගුනේ යැයි අනුමාන කිරීමට සාදක බොහෝය එනම්,

1.දේවදත්ත හිමියන් ශාසනයේ නායකත්වය ඉල්ලීම.
2.දේවදත්ත තෙරුන්ගේ පංචවර ආයාචනය.
3.කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ ඇති වූ ධර්මධර විනයධර ගැටුම.
4.ඡබ්බග්ගිය භික්ෂූන්ගේ නොහික්මුණු ක්‍රියාකාරකම්.
5. සාති භික්ෂුවගේ භවගාමී විඤ්ඤාණවාදය සහ වෙනත් අසංවර භික්ෂු භික්ෂුන්ගේ නොමනා ක්‍රියා කලාපයෙන්.
6.භික්ෂුනි ශාසනය ආරම්භ කිරීමේදී ගැටලු මතු වීම.
7.අග තනතුරු දීමේදී ඇති වු ගැටලු.

ii

* විසිරීගිය ධර්මය එක් රැස්කර කොටස් වලට බෙදා පොදුවේ සංඝ සම්මතය ලබා ගැනීම.
* සංගායනාව අවසානයේ ධර්ම විනය අනාගතය සඳහා ආරක්ෂා කර ගැනීමට ඒ ඒ භික්ෂු පරපුරවලට භාර දීම.
* කුඩා අනුකුඩා ශික්ෂා පද වෙනස් කිරීමට බුදුරදුන් දී තිබූ අවසරය භාවිතා නොකරන්නට තීරණය කිරීම.
* ආනන්ද හිමියන්ට එල්ල වී තිබූ චෝදනා වලින් උන්වහන්සේ නිදහස් කිරීම.

(ලකුණු 10 )


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440